# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2231/17 - 2021 ජුනි මස 11 වැනි සිකුරාදා - 2021.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය, සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 ජුනි මස 11 වැනි දින,
කොළඹ 01.
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි "**2021 අංක 09 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. මෙම රෙගුලාසි 2021 ජුනි මස 11 දින සිට ක්‍රියාත්මක වේ.

3. ශ්‍රී ලංකා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නිර්දේශය නොමැතිව කිසිදු අපනයනකරුවෙකු **I** උපලේඛනයේ දක්වා ඇති භාණ්ඩ අපනයනය සිදු නොකළ යුතුය.

4. මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට අදාළව පැන නගින ඕනෑම කාරණයක් සම්බන්ධයෙන් අවසාන තීරණය, ජාතික ආර්ථිකය, මහජන සෞඛ්‍ය සහ පාරිසරික ආරක්ෂාව යන කරුණු සැලකිල්ලට ගනිමින් ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් තීරණය කරනු ඇත.

1A - PG 5467 — 495 (2021/06)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

I උපලේඛනය

| | I තීරුව<br>සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය | II තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III තීරුව<br>විස්තරය |
|---|---|---|---|---|
| **1** | **28.04** | | | **හයිඩ්‍රජන්, විරල වායූන් සහ අනෙකුත් අලෝහ වර්ග.** |
| | | 2804.40.00 | - | ඔක්සිජන් |
| | | | | |
| **2** | **90.19** | | | **යාන්ත්‍රිකමය චිකිත්සක උපයෝගී උපකරණ ; සම්භාහන උපකරණ කට්ටල ; මනෝ විද්‍යාත්මක කුසලතාව පරීක්ෂා කිරීමේ උපකරණ කට්ටල ; ඕසෝන් චිකිත්සන, ඔක්සිජන් චිකිත්සන, එරසෝල් චිකිත්සන, කෘතිම ස්වසන හෝ අනෙකුත් චිකිත්සයමය ස්වසන උපකරණ කට්ටල.** |
| | | 9019.20.00 | - | ඕසෝන් චිකිත්සන, ඔක්සිජන් චිකිත්සන, එරසෝල් චිකිත්සන, කෘතිම ස්වසන හෝ අනෙකුත් චිකිත්සයමය ස්වසන උපකරණ කට්ටල. |

06 - 365

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.